ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ)උපාධි වැඩසටහන 2020/2021

5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2021

SNE5247/ESE5147-අන්තර්කරණ පන්ති කාමරවල ළමයින්ගේ ගැටළු සමඟ කටයුතු කිරීම

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2021.08.15 වේලාව -ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද , 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. අන්තර්කරණ පන්තිකාමරයක සිටින විශේෂ අවශ්‍යතා සහිත ළමයින් මුහුණ දෙන ගැටළු පහක් (05) ලයිස්තුගත කරන්න.

02. ශ්‍රී ලංකාවේ අන්තර්කරණ අධ්‍යාපනය සඳහා ඇති බාධක දෙකක් (02) පැහැදිලි කරන්න.

03. "අවම බාධා සහිත පරිසරය" යන පදය නිර්වචනය කරන්න.

04. අන්තර්කරණ පංති කාමරයක් සඳහා ඵලදායී කළමනාකරණ ක්‍රමෝපායන් පහක් (05) ලැයිස්තුගත කරන්න.

05. අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාවට නැංවීමට අපේ සමාජය තුළ ඇති ඍණාත්මක සාධක තුනක් (03) පැහැදිලි කරන්න.

06. "පුද්ගලානුබද්ධ ඉගෙනුම් සැලැස්ම" (IEP) කණ්ඩායමක සාමාජිකයන් නම් කරන්න.

07. ශ්‍රී ලංකාවේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමයින්ගේ ස්ථානගත කිරීම් තීරණයට අදාළ ගැටලු තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න.

08. ඵලදායී අන්තර්කරණ පාසලක් නිර්මාණය කිරීමට එම පාසලේ විදුහල්පතිවරයාට යොදාගත හැකි ප්‍රායෝගික ක්‍රමෝපායයන් තුනක් **(03)** නම් කරන්න.

(ලකුණු 05 x 08 = 40)

<u>2 වන කොටස</u>

09. (i) විශේෂ අවශ්‍යතා සහිත සිසුන් ඇතුලත් අන්තර්කරණ වාතාවරණයක් තුළ එම සිසුන්ගේ අවශ්‍යතා සැපිරීමේදී ගුරුවරයෙකුට තිබිය යුතු පූර්ව කුසලතාවයන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) විවිධත්වයකින් යුක්ත සිසුන් සමග කටයුතු කිරීමේ දී උපදේශකවරයෙකු ලෙස ගුරු භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. (i) ඔබ විශේෂ අවශ්‍යතා සහිත දරුවෙක් හදා වඩා ගන්නා දෙමාපියන්ගෙන් එක් අයෙක් ලෙස සලකා, එවන් දරුවෙක් හදාවඩා ගැනීමේ දී ඇතිවන අභියෝග උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට සහ ඔවුන්ගේ දෙමාපියන්ට දෙමාපිය සහයක කණ්ඩායම්වල වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

11. (i) විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා පාසල් මගින් අතිරේක ප්‍රතිපාදන සැපයිය යුතු ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමයින්ගේ සමාජීය අන්තර්ක්‍රියාවන්ට සමපදස්ථයන්ගේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු10)

12. (i) ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමින් සලකා බලන කල අන්තර්කරණ අධ්‍යාපනය උදෙසා අභියෝග රැසක් පවතී. එවැනි අභියෝග පහක් **(05)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) අන්තර්කරණ අධ්‍යාපනය සඳහා පහසුකම් සැලසීමට ශ්‍රී ලංකාවේ වර්තමාන අධ්‍යාපන ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීමේ දී රජයේ කාර්යභාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

13. (i) චර්යාමය ගැටලු සහිත ළමයින්ගේ ගති ලක්ෂණ උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 10)

(ii) ඔබ චර්යාමය ගැටලු සහිත සිසුවෙක්ගෙන් යුතු අන්තර්කරණ පන්තිකාමරයක ගුරුවරයෙකු යැයි සිතන්න. ගුරුවරයෙක් ලෙස ඔබට අත්විඳීමට සිදුවන ගැටලු මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

14. (i) "වඩා අන්තර්කරණ සමාජයන් කෙරෙහි ගුණාත්මක අන්තර්කරණ අධ්‍යාපනය මූල් වේ." සනාථ කරන්න. (ලකුණු 10)

(ii) පාසල්වල විශේෂ අධ්‍යාපන සහය කණ්ඩායම් සිටීමේ වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.